මිහිකත සැරිසර



දුම්බර මිටියාවතේ විස්මය

කුඩා ලෝකාන්තය

එන්. ටී ගමගේ

හුන්නස්ගිරියෙන් ලූල්වත්ත බලා යන පළමු බසය පිටත්වන්නේ පෙරවරු 7.00ටය. හුන්නස්ගිරියේ සිට ලූල්වත්තට ඇති දුර කිලෝමීටර් 11ක් පමණ වේ. මේ දුර යාමට බසයට පැයක පමණ කාලයක් ගතවන්නේ වැලමිටවංගු සහිත දුෂ්කර මාර්ගයක් තරණය කළ යුතු වූ බැවිනි. බස් රථයේ නොයා පෞද්ගලික මෝටර් රථයක ගමන් කරන්නේ නම් නවත්ත නවත්තා ගමනක් නැති බැවින් විනාඩි 35කින් 40කින් ලූල්වත්තට ළඟාවිය හැකිය.

ලූල්වත්ත ගැන කතා කළද ඇත්තටම ලූල්වත්ත බසයේ නැගී අපට යාමට අවශ්‍ය වන්නේ මේ කිලෝමීටර් එකොළහේ දුරින් තුනෙන් දෙකකට ආසන්න දුරක් පමණකි. අප යා යුත්තේ ඩීන්ස්ටන් වෙතය. ඩීන්ස්ටන් වන සංරක්ෂණ මධ්‍යස්ථානය සහ සංචාරක නිවහන වෙතය. හුන්නස්ගිරියේ සිට වම් පැත්තේ කන්දට දිවෙන මාර්ගයේ ඩීන්ස්ටන් දක්වා ඇති දුර කිලෝමීටර් හතකට මඳක් වැඩිය.

හුන්නස්ගිරියෙන් පටන් ගන්නා වැලිමිටි වංගු මාර්ගයේ කිලෝමීටර් බාගයක් පමණ ගිය පසු තේවතු හමුවේ. එතැන් සිට දිගින් දිගටම ඩීන්ස්ටන් දක්වා ද ලූල්වත්ත දක්වාද ඇත්තේ තද කොළ පැහැයෙන් වැසීගත් තේ යායවල් සහ අතරින් පතර ලැයිම් කාමර පේළිය. තැනින් තැන මතුවුණු ටර්පන්ටයින් ගස් සහ ඇල්බීසියා ගස් තේ යායේ පාළුව මැකීමට මෙන් නිරන්තරයෙන්ම වේගයෙන් හමන සුළඟින් ඒ මේ අත වැනෙයි.

ප්‍රපාතය හමුවන්නේ බොහෝ විට මාර්ගයට දකුණු පස හුන්නස්ගිරිය කඳු පන්තිය දෙසිනි. එම නිසාම පහළ සිට මෝදු වෙමින් එන ඝණ මීදුම් වළාවන්ගෙන් බස් මාර්ගයට ඉස්පාසුවක් ඇත්තේ නැත. කලකට පෙර තාර දැමූ මාර්ගය තැනින් තැන කැඩී ගොස්ය. කැඩුණු තැන්වල වාහන ගමන නිසා වළවල් හැරී ඇත. ලැයිම් කාමරවල සිටත් මාර්ගය දෙපස කලාතුරකින් දක්නට ඇති තනි නිවාසවල සිටත් උදෑසනින්ම පාරට බසින සුදු ඇඳගත් සෙරප්පු දමාගත් සිංහල, දෙමළ දරු දැරියන් පල්ලම් බසින්නේ මඩ වතුර පිරුණු මේ වළවල් උඩින් එකා පස්සේ එකා පනිමිනි.

අප මේ යන්නේ ශ්‍රී ලංකාවේ මධ්‍ය කඳුකරයේ අතිශයින්ම සංවේදී පරිසර පද්ධතියක් වන නකල්ස් රක්ෂිතය ආසන්නයටය. නකල්ස් රක්ෂිතයේ සම්පූර්ණ චාරිකාවක් කිරීම අපේ අරමුණ නොවේ. ඒ වෙනුවට අප යන්නේ නකල්ස් වන මායිමේ පිහිටි තවත් සුවිශේෂී ස්ථානයක් නැරඹීමටය. ඒ අන් කිසිවක් නොව කුඩා ලෝකාන්තයයි. හෝර්ටන් තැන්නේ පිහිටි සුප්‍රසිද්ධ ලෝකාන්තයෙන් පසුව ජනප්‍රියව ඇති තවත් ලෝකාන්ත කිහිපයක්ම ලංකාවේ ඇත. ඒවා සියල්ලක්ම හඳුන්වන්නේ කුඩා ලෝකාන්තය යනුවෙනි. මේ කුඩා ලෝකාන්ත අතරිනුත් මධ්‍ය කඳුකරයේ ඇති වඩාත්ම සුන්දර කුඩා ලෝකාන්තය ලෙස මේ නකල්ස් මායිමේ ඇති ලෝකාන්තය හැඳින්විය හැකිය. එය හෝර්ටන් තැන්නේ සුප්‍රසිද්ධ ලෝකාන්තයටත් වඩා අතිශය චිත්තාකර්ශනීය ස්ථානයක් බව සංචාරකයන් බොහෝ දෙනෙකුගේ අදහසයි.

තේවතු මැදින් වැටුණු සුන්දර මාර්ගයේ හති දමමින් නැගි බසයෙන් ඩීන්ස්ටන් වෙත ළඟාවන විට වේලාව උදෑසන 7.45 පසුවූවා පමණි. ඩීන්ස්ටන් සංචාරක නිවහන ඇත්තේ බස් මාර්ගය ආසන්නයේමය. නකල්ස් රක්ෂිතය අයත්වන්නේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවටය. ඩීන්ස්ටන් සංචාරක නිවහනේ නැවතී නකල්ස් වනයේ සංචාරය කිරීමට සහ කුඩා ලෝකාන්තය නැරඹීමට අවශ්‍ය නම් ඒ සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලිඛිත අවසරයක් ලබාගත යුතුය. කුඩා ලෝකාන්තය පමණක් නරඹන්නේ නම් මහනුවර සිට ඩීන්ස්ටන් දක්වා එක් දිනයක් ඇතුළත පැමිණ ආපසු යෑමේ හැකියාවද ඇත. කුමන ආකාරයකින් පැමිණිය ද ලූල්වත්ත පසුකොට නකල්ස් බලා යන සෑම සංචාරකයකුම ඩීන්ස්ටන් සංචාරක නිවහනෙන් ප්‍රවේශ පත්‍රයක් ලබාගත යුතුය.

කුඩා ලෝකාන්තය හැරුණු විට නකල්ස් වනයෙහි සංචාරය කිරීමට පැමිණෙන සංචාරකයකුට සංචාරය කළ හැකි තවත් ස්ථාන කිහිපයක් පිළිබඳවද සටහන් කිරීම වඩාත් වැදගත් යැයි සිතේ. ඩීන්ස්ටන් සංචාරක මධ්‍යස්ථානය වෙන් කරවාගෙන එන සංචාරකයන්ට දුම්බර මිටියාවතේ දී(නකල්ස්) දැකබලා ගත හැකි බොහෝ දේ ඇත. කුඩා ලෝකාන්තය හැරුණු විට ඩීන්ස්ටන් සිට යා හැකි ආසන්නතම සුන්දර ස්ථානය වන්නේ දෝතළුගල කඳු මුදුනයි. දෝතළුගල කන්ද පිහිටා ඇත්තේ ඩීන්ස්ටන් සංචාරක නිවහන පිටුපසිනි. යෝධයකු සේ නැගී සිටින දෝතළුගල කන්දේ මුදුනට ළඟාවීමට ඩීන්ස්ටන් සිට කිලෝමීටර් තුනහමාරක පමණ දුරක් පා ගමනින් යා යුතුය. කූඩැල්ලන්ගේ ප්‍රහාරය මැද පැය එකහමාරක දෙකක පමණ තරමක් දුෂ්කර නැග්මකින් පසුව සුන්දර දෝතළුගල මුඳුනට ළඟාවිය හැකිය.

ඩීන්ස්ටන් සිට යා හැකි තවත් සුන්දර ස්ථානයක් වන්නේ ගැරඩි ඇල්ලයි. මේ සඳහා ලූල්වත්ත පසුකොට යායුතු අතර කිලෝමීටර් 14ක් පමණ දුරකින් යුතු මේ මාර්ගයේ මාර්ගෝපදේශකයකු රහිතව ගමන් කිරීම තරමක් දුශ්කරය. දුම්බර මිටියාවතේ ඇති තවත් වැදගත් ස්ථානයක් වන්නේ වෙඩි ලුණු ගුහාවයි. වෙඩි ලුණු ගුහාවට යෑම සඳහා සංචාරකයන් ලූල්වත්ත පසුකොට මීමුරේ මාර්ගයේ සැතපුම් පහක් පමණ පල්ලම් බැස දකුණට හමුවන අතුරු මාර්ගයක් ඔස්සේ තවත් කිලෝමීටර් පහක් පමණ ගමන් කළ යුතුය. මෝටර් රථයකින් ගමන් කරන්නේ නම් වෙඩි ලුණු ගුහාවට යන සංචාරකයන්ට එය ගෙන යා හැක්කේ මීමුරේ මාර්ගයේ සිට දකුණට හැරෙන අතුරු මාර්ගය දක්වා පමණකි. අවසන් කිලෝමීටර් පහ දුෂ්කර මාර්ගයක් ඔස්සේ පා ගමනින් යා යුතුය.

මේ සියල්ලටම අමතරව දුම්බර මිටියාවතේ ඇති තවත් සුන්දරම ස්ථානයක් වන්නේ ඓතිහාසික මීමුරේ ගම්මානයයි. නකල්ස් කඳු වළල්ලෙන් වට වූ තැනිතලා බිමක පිහිටා ඇති අතිශය සුන්දර මීමුරේ ගම්මානයේ කටුමැටි ගැසූ ගෙවල් පහළොවකට විස්සකට වඩා නැත. මෙහි වාසය කරන සියලු දෙනාම ගොවිතැනින් ජීවිකාව සරි කරගනිති. ඒ නිසාම මීමුරේ ගම්මානයේ සෑම තැනෙකින්ම නිල් පැහැයෙන් බබළන කෙත්වතු දැකගත හැකිය. බසයෙන් පැමිණෙන සංචාරකයන්ට නම් මීමුරේ දක්වා යාම එතරම් පහසු නැත. බසය පැමිණෙන්නේ ලූල්වත්ත දක්වා පමණකි. ලූල්වත්තේ සිට මීමුරේ දක්වා ඇති දුර කිලෝමීටර් 12ක් පමණ වේ. අධික බෑවුම් සහිත මාර්ගයේ කිලෝමීටර් 12ක දුර පැය දෙකක් පමණ බැස යා හැකි නමුත් ආපසු ලූල්වත්ත දක්වා පැමිණීම අතිශය දුශ්කර කටයුත්තකි. ඒ නිසා මීමුරේ සංචාරය කරන්නෙකුට නම් අනිවාර්යයෙන්ම පෞද්ගලික මෝටර් රථයකින් පැමිණීමට සිදුවේ.

දැන් අපි නැවතත් ගමනේ ප්‍රධානම අරමුණ වන කුඩා ලෝකාන්තය දෙසට හැරෙමු. ඩීන්ස්ටන් සංචාරක නිවහනෙන් ප්‍රවේශපත්‍ර මිලදී ගැනීමෙන් අනතුරුව ප්‍රධාන මාර්ගයට නැවත පැමිණි අප ඊළඟට පිවිසියේ එය ඉදිරියෙන්ම පහළට දිවෙන ගුරු පාරකටයි. මේ ගුරු පාර දිවෙන්නේ සංචාරක නිවහන ඉදිරියේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉදිකරමින් පවතින වර්ග කිලෝමීටරයක පමණ භූමියක් වසාගත් උද්‍යානය හරහාය. එය පැමිණෙන සංචාරකයන්ට මදක් ගිමන් නිවා ගැනීම සඳහා තැනින් තැන ඉදිකළ ආසනවලින් ද කුඩා ජලාශයකින්ද සමන්විත වේ. උද්‍යානය පසුකොට අප පිවිසුණේ ෆයිනස් කැලෑවකටය. මධ්‍ය කඳුකරයේ තේවතු නිසරුව ගිය බෑවුම් බිම්වල ඇති කළ ෆයිනස් වනබිම් අතරින් තවත් එකක් වන මෙය මැදින් ගමන් කිරීම තරමක් සුන්දර අත්දැකීමකි. බොහෝ සිසිල් බව පරිසරයේ මුසුව ඇති නමුත් මෙහි ඇති එකම අඩුව වන්නේ කඳුකරයේ දී දැකගත හැකි එකම පක්ෂියකුවත් ෆයිනස් වනයේදී දැකගත නොහැකි වීමයි. පක්ෂීන්ට ආහාර ලබා ගැනීමට, නිවාස තැනීමට හෝ ගිමන් නිවීමට සුදුසු කිසිදු යෝග්‍ය තැනක් මේ විදේශික ශාකය සතුව නැති නිසා මෙහිදී කලාතුරකින් හෝ දැකගත හැකි වන්නේ සංචාරකයන් ඉවත දැමූ කැළිකසළ අවුස්සන්නට පැමිණෙන කපුටකු පමණි. මෙසේ නිහඬ ෆයිනස් කැලෑව මැදින් කිලෝමීටර් තුන්කාලක පමණ දුරක් ගමන් කළ පසු හදිසියෙන්ම වාගේ කුඩා ලෝකාන්තයේ මුදුණට ළඟා විය හැකිය. හදිසියෙන්ම වාගේ යැයි පැවසුවේ ෆයිනස් කැළෑවෙන් මෑත් වූ වහාම දැවැන්ත ප්‍රපාතය අබිමුවට පැමිණෙන බැවිනි.

මේ පිවිසුම් ස්ථානය අතිශය සුන්දර වූවකි. බෑවුම ආසන්නයේ තැනින් තැන නැගුණු ෆයිනස් ගස්වලින් සමන්විත බිම ඉතාම සාමකාමී තනනිල්ලකින් වැසී ඇත. ඒ දෙස බැලූ බැල්මටම අපට සිතුණේ රාත්‍රියේදී තණපත් කෑමට මෙහි එන හාවුන් පිළිබඳවය. ඊට හේතු වූයේ තණනිල්ල පුරාවට හාවුන්ගේ වසුරු විසිරී තිබීමය.

> මේ සියල්ලටම අමතරව දුම්බර මිටියාවතේ ඇති තවත් සුන්දරම ස්ථානයක් වන්නේ නකල්ස් කඳු වළල්ලෙන් වට වූ තැනිතලා බිමක පිහිටා ඇති අතිශය සුන්දර ඓතිහාසික මීමුරේ ගම්මානයයි.

හෝර්ටන් තැන්නේ පිහිටි ලෝකාන්තය මෙන් නොව මෙහි ඇති ප්‍රධානම විශේෂත්වය වන්නේ පහළ ප්‍රපාතය නැරඹිය හැකි කන්දේ ප්‍රපාත ගැටිය මීටර් 200ක් පමණ දුරක් විහිදී යාමයි. මේ නිසා වේදිකාවක් මෙන්වූ කුඩා ලෝකාන්තයේ ගැටියේ සිට පහළින් පෙනෙන විශාල ප්‍රදේශයක් දැකබලා ගත හැකිය.

පිවිසුම් ස්ථානයේ සිට එතරම්ම විශාල පහළ භූමි ප්‍රදේශයක් දැකගත නොහැකි නිසා අපි තවත් මීටර් 20ක් පමණ කන්දේ ගැටිය ඔස්සේ ඉහළට ගමන් කළෙමු. මීටර් 20ක පමණ උසක් මීටර් 50ක පමණ දුරක් ගෙවා පැමිණිය පසු හමුවන්නේ කුඩා ලෝකාන්තයේ අතිශය දර්ශනීයතම වේදිකාවයි. විශාල තණපිටියක් අද්දරින් පහළ නැරඹිය හැකි පරිදි මෙම ස්ථානය ස්වභාවික වේදිකාවක් ලෙසින් පිහිටා ඇත. මෙහි ඇති වඩාත්ම විස්මය දනවන කරුණ වන්නේ හෝර්ටන් තැන්නේ ලෝකාන්තයේදී මෙන් එක් දිශාවක් පමණක් නොව දිශා තුනක්ම ඉතා පහසුවෙන් දර්ශනය කරගත හැකි වීමයි.

අප මෙම ස්වභාවික වේදිකාව මතට පැමිණ මාර්ගය පිහිටි දකුණු පස කෙළවරේ ඈතින්ම පෙනෙන්නේ පිදුරුතලාගල කඳු මුදුනයි. එතැන් සිට ක්‍රමයෙන් ඉදිරියට හිස හරවන විට දර්ශනය වන්නේ තරමක් ඇස් මායිමට පහළින් හුන්නස්ගිරිය කඳු පන්තිය ඔස්සේ දිවෙන මහනුවර-මහියංගනය ප්‍රධාන මාර්ගයයි. හුන්නස්ගිරිය කඳු පන්තිය ඔස්සේ සර්පයෙකු සේ ඇදීයන මේ මාර්ගයේ විසිරුණු මීදුම අතරින් ගමන් කරන බස් රථ අපට පෙනෙන්නේ රෝද සවිකළ කුඩා ගිනිපෙට්ටි ලෙසිනි. ඉදිරියෙන්ම පෙනෙන මේ දර්ශනයෙන් තරමක් වම් පසට ඇස් යොමු කළ විට ඈත ක්ෂිතිජයෙන් පෙනෙන්නේ අම්පාර දක්වා දිවෙන භූමියයි. ක්ෂිතිජයේ යන්තමින් හඳුනාගත හැකි ලෙසට වළාකුළුවලින් මෑත්ව පෙනෙන හිරු රැස් වැටුණු සොරබොර වැව දැකගත හැකිය.

එතැන් සිට ක්‍රමයෙන් තවත් වම් පසට හිස හරවන විට ක්ෂිතිජය වසා ගනිමින් කිලෝමීටර් කිහිපයක් ඈතින් මහා දැවැන්තයෙකු සේ නැගී සිටින දුම්බර මිටියාවගේ ප්‍රධාන දුර්ගයක් වන දුම්බානාගල දර්ශනය වේ. මෙම කන්ද දුම්බානාගල නමින් හැඳින්වෙන්නේ දවසේ සෑම තත්පරයකම එහි මුදුණ මීදුමින් වැසී තිබීමයි. අවට ගම් වැසියන් පවසන ආකාරයට දුම්බානාගල මුදුන මීදුමින් තොරව දැකගැනීම ඔවුන්ට ද අතිශය දුලබ දර්ශනයකි. අප කළින් සඳහන් කළ ගැරඩි ඇල්ල ඇද හැලෙන්නේ මේ දුම්බානාගල ආසන්නයෙනි. ඊට මේ නම ලැබී ඇත්තේ ගැරඩියෙකු සේ ඉතා සිහින්ව, උසින් යුත්තව පහළට කඩා සැළෙන නිසාය.

කුඩා ලෝකාන්ත ප්‍රපාතයට වඩාත් ළංව බැලූ විට පහතින් පෙනෙන්නේ හුන්නස්ගිරිය අවට ඇති ගම්මාන ආශ්‍රිතව වගා කළ කුඹුරුය. ඉතාම සුන්දර මේ කෙත් වතු මැදින් තැනින් තැන ගලා යන කුඩා ඇල මාර්ග අප ඉදිරියේ ඇති දර්ශනයට වඩාත් වැඩි සුන්දරත්වයක් එක් කරවයි.

මේ සියලු සුන්දරත්වයන්ද සිහිල් සුළඟේ පහසද විඳිමින් මීදුමෙන් තොර පැය කිහිපයක් කුඩා ලෝකාන්තය මුඳුනේ ගතකළ අප ආපසු ඩීන්ස්ටන් වෙත ඒමට පිටත් වූයේ දහවල් දොළහට හිරු මුඳුන් වූ විටය. ඒ වන විටත් සංචාරක නිවහන වෙනුවට අප එදින රාත්‍රිය ගත කිරීමට වෙන් කරවා ගත කඳවුරු නිවාසය(දෝතළුගම පාමුල පිහිටි) අප වෙනුවෙන් මඟ බලා සිටියේය. ■